අබා චිත්‍රපටිය ගැන.

මං අවුරුදු විස්සකටත් වැඩි කාලයක් ඇති කරන් තිබුණ සිහිනයක් තිබුණා. ඒ සිංහල පුරාණ කථාවක් අතරින් එදා සමාජය ඇත්තටම ආසන්නව පෙන්වන සිනමාවක් ඇති වෙනව දකින්න. රජ කථා ඇති සිංහල චිත්‍රපටි තිබුණත් ඒ එකකටවත් අතීත පරිසරයට, පසුබිමට ළං වෙන්නවත් පුළුවන් වුණේ නෑ. ජගසෙන් කියන විදියටම මේවා වෙසක් නාට්‍ය රටාවෙන් කැඩුනේ නෑ. අපිට තරම් ලස්සන ඉතිහාස කතන්දර නැති බටහිර ජාතීන් මොන තරම් ලස්සන චිත්‍රපටි හදල තියෙනවද? බ්‍රැඩ් පිට් රඟපාන ට්‍රෝයි නගරය ගැන කථාව හෝමර්ගේ කාව්‍ය මත පදනම් වුණත්, නූතන සොයාගැනීම් ප්‍රයෝජනයට අරගෙන එදා වූ සමාජ සිද්ධිය යළි නිර්මාණයක් හැටියට ඉදිරිපත් කෙරුණ. ඒ වගේම තමා රිචඩ් ග්‍රේ රඟපාපු ආතර් රජුගේ කාලේ හිටියා කියන ලොකින්වර් නම් උතුම් නයිට්වරයාගේ කථාවත්. ඒකත් ඒ විදියට ආපස්සට යන්න උත්සාහ කළත්, පූර්ව නෝර්මන් යුගය පෙන්වනවට වඩා නෝර්මන් යුගයේ එංගලන්තය පසුබිම් කරල හැදුවා වගෙයි මට පෙනුනේ. කොහොම වුණත් ඇත්ත ඉතිහාසයට ඇත්තටම අපිව අරගෙන යන්න උත්සාහයක් එතැනත් තිබුණ. කාලය හරහා ආපස්සට අපව අරගෙන යන්න සිනමාවට පමණයි පුළුවන්. ඉංදියාවත් අසෝක වැනි චිත්‍රපටිවලින් පූර්ව යුග පෙන්වන්න උත්සාහ කළා. මං හැම වේලෙම හිතුවේ මේ හැමෝටම වඩා සුන්දර ලෙස ලියැවුණ පුරාණයක් අපට තියෙද්දී ඇයි අපට කාලය හරහා නූතන තාක්‍ෂණයෙන් යන්න බැරි වුණේ කියලයි. ඒත් මගේ යටි හිතේ විලාපය සුන් කරමින් සුන්දර ගමනක් පියාඹන්න එක්කන් යන්න මා නොසිතූ ලෙසට ජගසෙන් අන්තනීයන්ට අබා චිත්‍රපටියෙන් හැකි වුණා. කටු කිහිපයක් ඇණුනත් මොන තරම් සුන්දර ගමනක්ද? මං හිතන්නේ මේ සිනමාව තුළින් විශ්ව ජනප්‍රිය ප්‍රචලිත සිනමාවට අපි කඩා පැන්න කියලයි. හෝමර්ගේ සුන්දර ගමනට, වයිකින් සාගාවල සුන්දර ගමනට, රොබින් හුඩ්ගේ වීර ලෝකයට, අසෝකගේ මහා සම්ප්‍රාප්තියට ආදී සියල්ලන් අතර වැජඹෙන රන් තරුවක් මගේ පුංචි රටෙන් ජගසෙන් අන්තනීයෝ ඇති කරල දුන්න. හැම නළුවෙක්ම, යම්තම් පෙනෙන කුඩා චරිත කළ අය පවා ඇත්තටම පුරාණ වත පිහිටුවීමට ක්‍රියා කළා. මං එක්කෙනෙක්ගේ වත් නම් කියන්නේ නෑ. මොකද? ඒක සිය ගණනකට කරන නොසැලකිල්ලක් වෙන්න පුළුවන්.

මං දැන් මට ඇණුන කටු ගැන ලියන්න අවසර පතනව. හෝමර්ගේ කවියේ පුරාම තියෙන්නේ එදා විශ්වාස කළ දෙවිවරුන්ගේ වැඩ ගැන. ඒක අනුව බැළුවහම වීරයෝ, ඇකිලීස් ඇතුළුව, නිකම් දෙවිවරුන්ගේ පඹයෝ. ඒත් සිනමාව ඒව පිහල දාලා ඉතිහාසේ සිදු වූ සමාජ කථාව අපට මවා පානවා. එත් මෙතැනදී ජගසෙන් කරන්නේ මහා වංශයේ අහම්බයෙන් දමල තියෙන අද්භූතයක් වඩා විදිමත්ව සකස් කරල ශුද්ධ වූ දේව කථාවක් යටි තලයේ පිහිටුවීමයි. මට හිතුනේ චිත්‍ර මගින් ක්‍රිස්තුදේව චරිතය හා ගැලවුම්කාරයාගේ ගමන මේ චිත්‍රපටියට අතුළ් කළා කියලයි. ආගමික හැඟීමක් කලාකරුවෙකුට ඇති වුණා නම් ඒකට මට දොස් කියන්න බෑ. ඒත් සිංහලේ පුරාණය පිළිබඳ කථාවට එයින් අවුලක් වුනා කියලයි මට හිතෙන්නේ. අනෙක යකෙක් මැරුණහම මහ යකෙක්, බිම්බ යකෙක් මිස දෙවියෙක් වෙන්නේ නෑ.

ඊළඟට මට පෙනුනේ සිංහල රජුට අවනත නොවන යක්‍ෂ ගම්මානවල තිබිය යුතු මූලික ලක්‍ෂණ එළි වුණේ නෑ කියලයි. කුවේණි මුල් වූ රටක අවුරුදු සීයකට පස්සේ මාතෘමූලික යක්‍ෂ සමාජය මුළුමණින්ම බිඳවැටුනද? ජගසෙන් ඉතාම හොඳින් කාන්තාවන් ඉතාම නිදහස්ව, නිසඟව තමන්ගේ කැමැත්ත අනුව නටන, අඬන හා පෙම් කරන ලෝකයක් පෙන්වනව. ඒත් අම්මාවරුන්ගේ පාලනයට අයිතියක් නම් යන්තම්වත් පෙනෙන්නේ නැහැ. නූතන සොයා ගැනීම් අනුව ක්‍රි.පූ. තුන්වන සියවසට හා ඊටත් පෙර ලංකාවේ සිංහල රාජ්‍ය ඉතා සීමිත එකක්. රට පුරා තිහ, හතළිහක් පෙදෙස් හා ගම් ස්වාධීන පාලන යටතේ තිබුණ. ගමනි හා පෙරුමක පවුල් මුල්වුණ මේවා සියවස් ගණනාවක් ගොඩනැගුණ දේශීය පාලන ඒකකයන්. ඒ ඔක්කොම සංස්කෘත, ප්‍රාකෘත කථා කරන බමුණන් පිළිගන්න ජනපදයන් නොවේ. කොහොමටත් කුමරා සැඟ වී සිටි දොරමඩලාව යක්‍ෂ ජනපදයක්. ඒක බමුණන් හිස්මුඳුනින් පිළිගත් පීතෘමූලික ජනපදයක් නෙවෙයි. එනිසාමයි කුමරා වෙනම

චින්තනයක් ඔස්සේ හැඩගැහුණේ. අංශුව කොහෙන් ආවත් කුමරා යක්ෂ කුමරෙක් වුණේ යක්ෂ ගමේ යක්ෂ පවුලක තරුණ වෙනකම් හැදුන නිසා. ඇත්ත තමයි ජගසෙන් ස්වාධීන යක්ෂ සමාජය පෙන්වන්න හැම පැත්තකින්ම මැදිහත් වෙනව. නැටුම්, ගීත, සිරිත් විරිත් ආදී හැම පැත්තෙන්ම බරපතල වැඩකොටසක් එයා කරල තියෙනව. ඒත් බමුණන් නැතිව ගැහැණුන්ම පූජකයන් වූ කුවේණිගේ කාන්තා පාලන ස්වභාවය පෙන්වන අම්මාවරුන්ගේ බලය ජගසෙන් අමතක කළා. මට හරිම දුකයි මේ කාරණා දෙක ගැන.

ඒත් මොනව කරන්නද? කුඹියෙක් තියා මැස්සෙක් වැටුණත් මං රජ බොජුනක් විසි කරන්නේ නෑ. මැස්සා අඩුවෙන්ම ගෑටෙන ලෙසට ඉවත් කරල රජ බොජුන රස කර කර ගිල දමනව. ඒ වගේ මේ මනස්කාන්ත සුන්දර ගමන මං තව සැරයක්, දෙකක් හෙමිහිට යන්න ඕන. ලෝකය පුරාම මිනිසුන්ව හොල්මන් කරමින් මේ ගමනට එකතු කර ගනීවි. මහ වංශය හරි දිගයි. මං හිතන්නේ ලෝකයේ දිගම වංශ කථාව. ඒ පැත්තෙන් බැළුවත් ජගසෙන් මහ කලාකරුට තව ගොඩක් වැඩ තියෙනව, කරන්න.

ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න.
24.07.2008